# කාර්යය පත්‍රිකාව 08

**1. පන්තිය - 6 ශ්‍රේණිය** **විෂයය - ගණිතය** **අදාල සතිය - 9 - 4 සතිය**

**2. පාඩම හෝ ඒකකය - ද්‍රව මිනුම්**

**3. මෙම පාඩම තුලින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල**

I. ද්‍රව ප්‍රමාණ මැනීම සඳහා ml, l භාවිතා කරන බව හඳුනා ගනියි.
II. දෙන ලද ද්‍රව ප්‍රමාණ මැනීම සඳහා ml, l අතුරින් සුදුසු ඒකක තෝරා ගනියි.
III. ml, l අතර සම්බන්ධය ප්‍රකාශ කරයි.
IV. දෙන ලද ද්‍රව ප්‍රමාණ ml, l වලින් නිමානය කරයි.
V. ml, l ඒකක පරිවර්තනය කරයි.
VI. ml, l ඇතුළත් ද්‍රව පරිමා එකතු කරයි.
VII. ml, l ඇතුළත් ද්‍රව පරිමා අඩු කරයි.
VIII. දෛනික කටයුතුවල දී ද්‍රව පරිමා මැනීම සඳහා සුදුසු ඒකක භාවිත කරයි.

**4. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්**

I. නිවසේ ඇති ද්‍රව මනින ද්‍රව්‍ය 10 ක නම් ලියා ඒවායේ සඳහන් ඒකකය ද ලියන්න.
II. ද්‍රව මනින ඒකක සඳහන් කර ඇති ඇසුරුම් හෝ ලේබල් එකතු කර පොත් පිංචක් සකස් කරන්න.
III. ඔබ නිවසේ ඇති මේස හැන්දක් ගෙන එයින් පහත සඳහන් භාජන පිරවීමට කොපමණ වාර ගණනක් ජලය දැමිය යුතු දැයි පරීක්ෂා කරන්න.

(ජෑම් බෝතලයක්, යෝගට් කෝප්පයක්, වීදුරුවක් )

IV. පාඩමට අදාල 16.1 ක්‍රියාකාරකම කරන්න.
V. Enenapiyasa, e-thaksalawa, DP Education, පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් ද්‍රව මිනුම් පාඩමට අදාල ඉගැන්වීම් ලබාගෙන ඉගෙනගන්න.
VI. පාඩමට අදාල වන 16.1, 16.2, 16.3 අභ්‍යාස කරන්න.

**5. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්,website හා ඉගෙනුම් ආධාරක**

I. https://enenapiyasa.lk/ 6 ශ්‍රේණිය ගණිතයට අදාල සබැඳුම්
II. https://www.e-thaksalawa.moe.gov.lk 6 ශ්‍රේණිය ගණිතයට අදාල සබැඳුම්
https://www.ethaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=796#section-2
III. DP Education හි https://www.youtube.com/watch?v=A4Tz_LufC5E
IV. අතිරේක කියවීම් - https://www.deshaya.lk/article/43/features/12416
http://www.vidusara.com/2020/02/05/feature3.html
http://www.waterboard.lk/web/index.php?option=com_content&view=article&id=31&Itemid=189&lang=si

**6.** ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය

1) පහත දැක්වෙන ද්‍රව ප්‍රමාණ මිලිලීටරවලින් දක්වන්න.

1) 2 *l* 2) 5 *l* 3) 3 *l* 250 *ml* 4) 2 l 750 *ml*

2) පහත දැක්වෙන ද්‍රව ප්‍රමාණ ලීටරවලින් දක්වන්න.

1) 4000 *ml* 2) 6000 *ml* 3) 5000 *ml* 4) 9000 *ml*

3) පහත දැක්වෙන ද්‍රව ප්‍රමාණ එකතු කරන්න.

| | *l* | *ml* |
|---|---|---|
| | 5 | 700 |
| + | 2 | 150 |

| | *l* | *ml* |
|---|---|---|
| | 3 | 250 |
| + | 1 | 135 |

| | *l* | *ml* |
|---|---|---|
| | 5 | 800 |
| + | 4 | 700 |

| | *l* | *ml* |
|---|---|---|
| | 2 | 600 |
| + | 1 | 500 |

4) පහත දැක්වෙන ද්‍රව ප්‍රමාණ අඩු කරන්න.

| | *l* | *ml* |
|---|---|---|
| | 8 | 350 |
| - | 2 | 125 |

| | *l* | *ml* |
|---|---|---|
| | 7 | 700 |
| - | 3 | 450 |

| | *l* | *ml* |
|---|---|---|
| | 8 | 225 |
| - | 7 | 650 |

| | *l* | *ml* |
|---|---|---|
| | 7 | 375 |
| - | 2 | 850 |

5) තැඹිලි ගෙඩියක 650 *ml* ක පමණ තැඹිලි වතුර ඇත. මේ අනුව තැඹිලි ගෙඩි 20 ක ඇති තැඹිලි වතුර ප්‍රමාණය නිමානය කර ලීටර හා මිලිලීටරවලින් දක්වන්න.

නිලධාරියාගේ නම:- ඩී.එම්.එන්.කේ. දසනායක පාසල:- කෑ/මාව/ මාකෙහෙල්වල ක.වි.